# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,452 - 2025 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2025.08.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1662 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1670 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1659- B 82714— 5,403 (2025/08)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රජයේ නිලධාරින්ගේ යහසාධක සංගමය (G.O.B.A)

"ලේකම් හා ගණකාධිකාරී" තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

මෙම සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරි තනතුරවන **"ලේකම් හා ගණකාධිකාරී"** තනතුරට ද්විතියන පදනම යටතේ පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සපුරා ඇති රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. සුදුසුකම්** :
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ/ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ
- ශ්‍රී ලංකා දේශීය ආදායම් බදු සේවයේ III ශ්‍රේණියේ/ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පංතියේ අධි ශ්‍රේණියේ නිලධාරියකු

හෝ

- කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි පන්තියේ නිලධාරියකු වීම හෝ
- කළමනාකරණ සේවා නිලධාරි සේවයේ හෝ සමාන්තර සේවයක 1 වන පන්තියේ හෝ ඉන් ඉහළ පන්තියක වසර 05 ක පළපුරුද්ද සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් හෝ ඊට සමාන සුදුසුකම් සහිත නිලධාරියකු වීම.

**2. අවශ්‍යතා :**

2.1 කොළඹට සැතපුම් 35ක් තුළ ස්ථිර පදිංචිය.

2.2 2025.09.30 දිනට වයස අවු. 55 ට වැඩි නොවීම.

2.3 රාජ්‍ය සේවයේ වසර 15 ට නොඅඩු ස්ථිර සේවා කාලයක් තිබීම.

2.4 ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳ ප්‍රාමාණික දැනුමක් /හැකියාවක් තිබීම.

2.5 පරිගණක සාක්ෂරතාවය හා Internet & Email භාවිතා කිරීමේ හැකියාව.

2.6 ඉංග්‍රීසි භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව.

2.7 දෙමළ භාෂාව දැන සිටීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ඇත.

2.8 අවම වසර 2ක ද්විතියන පදනම යටතේ නිදහස් කිරීමට සේවා ප්‍රධානී/ පත්වීම් බලධාරිගේ කැමැත්ත.

**3. වැටුප :**

3.1 අයදුම්කරු රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නිත්‍ය තනතුර යටතේ ලබන මූලික වැටුප හා අනුමත සියලු දීමනා.

3.2 සංගමය විසින් ලබා දෙන මූලික වැටුපෙන් 50% ක්වූ දීමනාව.

3.3 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2020 අනුව විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කිරීම සඳහා මූලික වැටුපෙන් 25% ක් ප්‍රේෂණය කරනු ඇත.

**4. රාජ්‍ය සේවයෙන් නිදහස් කිරීම (අංක 2310/29 දරන 2022 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව -**
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික (I කාණ්ඩයේ) රීති 166 සමග කියවිය යුතු 178 රීතිය අනුව - පරිශිෂ්ට අංක 12 ප්‍රකාර - නිලධාරියාගේ කැමැත්ත ප්‍රකාශිත ආකෘතිය සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවය ද ලබාගෙන ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. (www.psc.gov.lk වෙබ් අඩවියෙන් ආකෘතිය භාගත කළ හැක.)

**2025.09.30 දින දහවල් 12.00** ට පෙර ලැබෙනසේ ඔබ විසින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් (ඉහත 4 අනුව නිදහස් කළ හැකි බවට සහතික කර) පහත සඳහන් ලිපිනයට කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ලේකම් හා ගණකාධිකාරී තනතුර සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඩී. එස්. පී. දුනුසිංහ,
සභාපති,
රජයේ නිලධාරින්ගේ යහසාධක සංගමය.

2025 අගෝස්තු මස 29 වැනි දින,
65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02,
දුරකතන අංක : 011-2434598, 2473633, 2473577
ෆැක්ස් : 0112434212 වෙබ් අඩවිය : www.goba.lk

08-357

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

***රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියට කුසලතා ධාරාව යටතේ බඳවා ගැනීම - 2025***

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 03ක් කුසලතා ධාරාව යටතේ පිරවීම සඳහා පහත සුදුසුකම්ලත්, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සක්‍රිය සේවයේ යෙදී සිටින නිලධාරින්ගෙන් පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2025.09.26** දින වේ.

*සටහන* : අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද සහ කුසලතාවය සඳහා ලකුණු ලබාදෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සපුරා ඇති බවට පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා නිලධාරින් පත්කරනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 05 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය පරිදි පත්වීම් ලිපි නිකුත් කරනු ලබන දිනය හෝ ඊට පසු දිනයක් වනු ඇත.

**02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(II) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

(III) අංක 18/2020 හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි හා ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතු ය.

(IV) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කර ඇති අංක PSC/EST/2/1/25/1/4/2011 හා 2013.10.22 දිනැති රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(V) රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියට පත් වී වසර තුනක් (03) ගත වීමට පෙර බඳවා ගැනීමේ පටිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(VI) ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**03. වැටුප් පරිමාණය :**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු.82,150 -10x2,400 - 8x2,940 - 17x3,900 – රු. 195,970/- (SL-1-2025) වේ.

එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ.

**04. සුදුසුකම් :**

**4.1 අධ්‍යාපන සුදුසුකම් :** අදාළ නොවේ.

**4.2 පළපුරුද්ද** :

(අ) අයදුම්පත් කැඳවන අවසන් දිනයට රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ (කළමනාකරණ සහකාර - අධිපන්තිය සේවා ගණයේ) අවම වශයෙන් වසර 08ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**4.3 කායික සුදුසුකම් :**
සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.4 වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හා එහි සංශෝධනයන් හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට, බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් කර ඇති සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4.5 වයස් සීමාව
අදාළ නොවේ.

**05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන විස්තරාත්මක ලකුණු ලබාදීමේ පටිපාටිය

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | සේවා පළපුරුද්ද-<br>ඉහත අනු අංක 4.2 යටතේ සඳහන් මූලික සුදුසුකමට අමතරවවන සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා එහි සංශෝධනයන් හි විධිවිධාන අනුව, අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදීමේ දී වැඩිම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට මුළු ලකුණු ලබාදෙන අතර, සෙසු නිලධාරින්ට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදීම ද සිදුකරනු ලබයි. (මාස 06 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | **50** |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02. | කුසලතාවය<br><br>2.1 වෘත්තීය සුදුසුකම් :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් එම කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ රජයේ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක් මගින් ලබා ගත්, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය හෝ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ සුදුසුකමක් සඳහා,<br><br>2.2 තනතුරට අදාළ විෂය කරුණු හා නීති රෙගුලාසි පිළිබඳ දැනුම<br><br>I. විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමට අදාළ විෂය කරුණු හා නීති රෙගුලාසි පිළිබඳ දැනුම<br>II. ලේඛන ලියාපදංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ විෂය කරුණු හා නීති රෙගුලාසි පිළිබඳ දැනුම<br>III. සාමාන්‍ය කාර්යාල පරිපාලන දැනීම | 05<br><br>10<br>10<br>10 | 35 |
| 03. | භාෂා හැකියාව-<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා,<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක්.<br><br>(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS සමස්ත ලකුණ 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම.<br><br>(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජය පිළිගත් වෘත්තීය ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ හදාරන ලද මාස තුනකට (03) වැඩි ඩිප්ලෝමා සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 01 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.) | 05<br><br>04<br><br>03<br><br>02 | **05** |
| 04. | පරිගණක දැනුම-<br>(තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම)<br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා,<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක්,<br><br>(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්,<br><br>(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පාඨමාලා හදාරා/පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබාගත් සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 01 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.).<br><br>*සටහන* : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. | 05<br><br>04<br><br>03<br><br>02 | **05** |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම-<br>I. නායකත්වය<br>II. සන්නිවේදන කුසලතා<br>III. පෞරුෂත්වය | <br>02<br>02<br>01 | **05** |
| | **මුළු එකතුව** | | **100** |

** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට සේවයේ නියුක්ත අපේක්ෂකයින් පමණක් කැඳවනු ලැබේ.

06. **අයදුම් කිරීමේ ක්‍රමය** :

6.1 මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. ආදර්ශ අයදුම්පතට අනුකූලව පමණක් අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් විසින් තමාගේ අයදුම්පත් පිළියෙළ කරගැනීම අවශ්‍ය වේ.

6.2 අයදුම්පත්‍රය සෙ.මී. 22 – 29 ප්‍රමාණයේ A 4 කඩදාසිවල සකස් කලයුතු අතර, 1.0 – 3.4 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන, තුන්වන හා සිව්වන පිටුවලට ද අඩංගුවන ලෙස ගෙන කඩදාසියේ දෙපසම භාවිතා කර සකස් කළ යුතු අතර අයදුම්පත්‍රය පරිගණකය ආධාරයෙන් පිළියෙළ කර, අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත *ගැසට්* නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේපවන බවත් වැඩිදුරටත් දන්වමි.

6.3 අයදුම්පත සකස් කිරීමේ දී එහි ශීර්ෂයේ සඳහන් නම, සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

6.4 අදාළ අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු/ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු විසින්ම සිදු කළ යුතු වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් සහතික කර යොමු කළ යුතු වේ.

6.5 සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් **2025.09.26** දිනයට හෝ ඊට පෙර "රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, අංක 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල" යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

6.6 අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියට කුසලතා ධාරාව යටතේ බඳවා ගැනීම - 2025" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

6.7 අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය. එසේ වුවත්, තමන් සඳහන් කරනු ලබන තමන්ගේ සුදුසුකම් සනාථ කරන ලියවිලි ඉල්ලූ අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට සූදානමින් තබා ගත යුතුය.

***සැලකිය යුතුය*** **:**

i. සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය අයදුම්කරුගේ නමින් අයදුම්කරුගේ කාර්යාලයීය ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ.

ii. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

iii. පත්වීම සඳහා සුදුසුකම් ලබන යම් අයදුම්කරුවෙකු එම පත්වීම පිරිනමන අවස්ථාවේ දී බලපැවැත්වෙන රෙගුලාසි හා විධිවිධානයන් යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ, හැසිරීම කරන කොටගෙන හෝ පත්වීම් නොදීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

07. සාවද්‍ය තොරතුරු සැපයීම:

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

❖ පුරප්පාඩු සියල්ල පිරවීම හෝ නොපිරවීම හෝ අර්ධ වශයෙන් පිරවීම හෝ මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණක් පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල භාෂා මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එස්. ආලෝක බණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 අගෝස්තු මස 07 වැනි දින.

**ආදර්ශ අයදුම්පත**

***රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියට කුසලතා ධාරාව යටතේ බඳවා ගැනීම - 2025***

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල - 2 / දෙමළ - 3) ☐

*සටහන* : අයදුම් කරන මාධ්‍ය පසුව වෙනස් කළ නොහැක.

---

1.0

1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.2 සම්පූර්ණ නම : ........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 මුලකුරු සමග නම (මයා/මිය/මෙය): ........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)
උදා: එම්.ජී.බී.එස්.කේ. ගුණවර්ධන

1.4 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................................................

2.0
2.1 කාර්යාලයීය ලිපිනය :..........................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)
2.2 කාර්යාලයීය ලිපිනය : ..........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0
3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

3.4 ජාතික හැඳුනුම්පත් අංකය :

4.0
4.1 කාර්යාලයීය දුරකථන අංකය :
4.2 පෞද්ගලික දුරකථන අංකය :

5.0
5.1 රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ තනතුරට පත් වූ දිනය : ..........................................................................
5.2 එම තනතුරේ ස්ථිර කරන ලද දිනය : ......................................................................
5.3 එම තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ දිනය : ......................................................
5.4 රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ වසර 08 සම්පූර්ණවන දිනය : ....................................... ..................
5.5 සේවා කාලය තුළ යම්කිසි විනයානුකූල කටයුත්තකට යටත්ව තිබේ ද, එසේ නම් ඒ පිළිබඳව තොරතුරු කෙටියෙන් දක්වන්න : ..........................................................................................................................................

6.0 වර්තමාන සේවා ස්ථානය : .........................................................................................

7.0 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 05 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබාගැනීමට අදාළ විස්තර :

7.1 සේවා පළපුරුද්ද : ........................................................................................................................
........................................................................................................................

7.2 කුසලතාවය : ........................................................................................................................
........................................................................................................................

7.3 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම : ..............................................................................................................

..............................................................................................................

7.4 භාෂා හැකියාව : ..............................................................................................................

..............................................................................................................

- අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර, එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම් කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

8.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(ඔව් නම් විස්තරය සඳහන් කරන්න)
..............................................................................................................

9.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මා දන්නා බවත්, සියලු නීති රීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

................................................ ............................................,

දිනය. අයදුම්කරුගේ අත්සන.

*සටහන* - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු ඉදිරිපිට දී අයදුම්කරු අත්සන් කළ යුතුය.

**10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................................ මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ ඇය මා ඉදිරිපිට දී, ....................................... වැනි දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

............................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :.................................................
තනතුර :.................................................
ලිපිනය :.................................................
දිනය :.................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :**

ඉහත විස්තර සඳහන් ............................................................................ මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ .............. ..................................................... තනතුරක සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදිවන බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත් මෙයින් සහතික කරමි.

..........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

08-326

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

***රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියට සීමිත ධාරාව යටතේ බඳවාගැනීමේ තරග විභාගය - 2025***

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 03 ක් සීමිත ධාරාව යටතේ පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් 2024.03.17 දිනට සක්‍රීය සේවයේ නියුතුව සිටින නිලධාරින්ගෙන් පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ wwwdoenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 සැප්තැම්බර් මස 01 වැනි දින පෙ.ව. 9.00** ට විවෘත වන අතර **2025 සැප්තැම්බර් මස 26 වැනි දින රාත්‍රී 9.00**ට අවසන්වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙ හි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

**1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලකුණු ලබාගන්නා අපේක්ෂකයින්ගේ වැඩිම ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. අයදුම්කරුවන්ගේ සුදුසුකම් රාජ්‍ය

සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

තව ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 අනුව, කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේ දී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබාගත් සුදුසුකම්ලත් අපේක්ෂකයින් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදුකිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරාගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්තය.

I. අපේක්ෂකයින්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
II. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය පරිදි පත්වීම් ලිපි නිකුත් කරනු ලබන දිනය හෝ ඊට පසු දිනයක් වනු ඇත.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
III. අංක 18/2020 හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙ හි හා අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතුය.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කර ඇති අංක PSC/EST/2/1/25/1/4/2011 හා 2013.10.22 දිනැති රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීමේ පටිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.
V. රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියට පත් වී වසර තුනක් (03) ගත වීමට පෙර බඳවාගැනීමේ පටිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
VI. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**3. වැටුප් පරිමාණය**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය

රු.82,150–10x2,400–8x2,940–17x3,900–රු. 195,970/- (SL-1-2025)

**4. සුදුසුකම් :**

**4.1 අධ්‍යාපන සුදුසුකම් :** අදාළ නොවේ.

**4.2 පළපුරුද්ද** :

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ ස්ථිර කර තිබීම.
(ආ) රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ අවුරුදු 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 සහ එහි සංශෝධනයන් හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**4.3 කායික සුදුසුකම් :**
සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙ හි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

4.4 *වෙනත් සුදුසුකම්* :
- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට, බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් කර ඇති සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4.5 *වයස් සීමාව* : අදාළ නොවේ.

05. ලිඛිත විභාගය :

5.1 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

5.2 විභාගය භාෂා ත්‍රිත්වයෙන් ම පවත්වනු ලැබේ. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

5.3 ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ. :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම | පැය 03 | 100 | 40% |
| විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම | පැය 03 | 100 | 40% |

5.4 විභාගය සඳහා අදාළවන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම | (අ) ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පනවන ලද නියෝග<br>(ආ) ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් විටින් විට නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් |
| විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම | (අ) විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පනවන ලද නියෝග<br>(ආ) විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් විටින් විට නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් |

**6. විභාග කොන්දේසි :**

6.1 අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයින් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලට ම පෙනී සිටිය යුතුය.

6.2 විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය. :

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions),
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon),
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

6.3 මෙම විභාගය **2025 නොවැම්බර් මස කොළඹ දී** පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

6.4 අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* : ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

6.5 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

6.6 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

6.7 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත්, තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුවකුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

6.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

6.9 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති වරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ. :

I. ජාතික හැඳුනුම්පත,

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,

III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

6.10 එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**සැලකිය යුතුය :**

(අ) ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවක දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ආ) විභාග ප්‍රවේශ පත්‍රය අයදුම්කරුගේ නමින් අයදුම්කරුගේ කාර්යාලයීය ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ.

(ඇ) පත්වීම සඳහා සුදුසුකම් ලබන යම් අයදුම්කරුවකු එම පත්වීම පිරිනමන අවස්ථාවේ දී බලපවත්වන රෙගුලාසි හා විධිවිධාන යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ, හැසිරීම කරණ කොටගෙන හෝ මෙම පත්වීම නොදීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**7. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

❖ කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීම ද මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

8. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 ජූලි මස 31 වැනි දින.

08-325

**අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින බන්ධනාගාර නියාමක (කාන්තා/පිරිමි) තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- මෙම විභාගය මඟින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තු පොලිස් හා අනිකුත් නියාමන සේවා ගණයේ බන්ධනාගාර නියාමක තනතුර සඳහා වේ.

***සැළකිය යුතුයි*** :- ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් මෙම දැන්වීමේ 12 වගන්තියේ (1) , (2) හා (3) අනු වගන්ති මඟින් දැක්වෙන ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවේ. එබැවින් එකී වගන්තිවල සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන් පමණක් අයදුම් කිරීම අපේක්ෂා කෙරේ.

02. විභාග දිනය සහ විභාගය පැවැත්වීම :-

මෙම විභාගය 2025 නොවැම්බර් මස උපලේඛනය - 1 හි දැක්වෙන දිවයින පුරා පිහිටි ප්‍රධාන නගරවල දී පැවැත්වෙනු ඇත. දක්වා ඇති උපලේඛනයේ සඳහන් නගර අතරින් විභාගය සඳහා පෙනී සිටීමට අපේක්ෂිත නගරය, අංකය සමග පැහැදිලිව දැක්විය යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එහෙත් කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් අයදුම්කර නොමැති වුවහොත්, අයදුම්කරු විසින් අයදුම්පතේ දෙවන තේරීම යටතේ සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත ඔවුන් යොමු කරනු ඇත. යෝජිත නගර සියල්ලෙහි ම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් අයදුම්කර නොමැති වුවහොත් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමටත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු යොදනු ඇත.

උපලේඛනය - 1

| නගර හා නගර අංක | |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| මඩකලපුව | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුරය | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |

03. පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 479 කි. [ බන්ධනාගාර නියාමක (පිරිමි) - 409 , බන්ධනාගාර නියාමක (කාන්තා) – 70] අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

04. **සේවා කොන්දේසි :**

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 දිනැති අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව අපේක්ෂකයකු අදාළ තනතුරේ බන්ධනාගාර නියාමක තනතුරට පත්කරනු ලැබේ.

4.2 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. බන්ධනාගාර නියාමක තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත්වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ප්‍රදේශයක රාජකාරි භාර ගැනීමට ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත. බන්ධනාගාර නියාමක තනතුර සඳහා පත්වීම් ලබන්නන් පත්වීම් ලැබ මුල් වසර 05 ස්ථිර පදිංචි ප්‍රදේශයෙන් බැහැර බන්ධනාගාරවල තනිකඩ නිල නිවසේ රැඳී සේවයේ නිරතවන බවට එකඟ විය යුතුය.

05. මාසික වැටුප් පරිමාණය :-

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි RS 1 – 2025 (පියවර 1) වැටුප් ඛණ්ඩය අදාළ වේ. එම වැටුප් ඛණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 49,550- – 7 x 540 – 27 x 670 – රු. 71,420 /- (මාසික)

(2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු. 49,550/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ.)

06. බඳවා ගැනීමේ සුදුසුකම් :-

(අ) (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුය. එය පොලිස් නිශ්කාෂණ වාර්තාවක් මඟින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.
(iii) චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.
(iv) අවම උස අඩි 5 අඟල් 4 (පිරිමි)
(v) අවම උස අඩි 5 අඟල් 2 (කාන්තා)
(vi) පපුව හුස්ම නාල්ලා අඟල් 32ට නොඅඩු විය යුතුය. (කාන්තාවන් සඳහා අදාළ නොවේ)
(vii) අවිවාහක විය යුතුයි. (දික්කසාද වූවන් හා වැන්දඹුවන් මේ සඳහා විවාහකයන් සේ සලකනු ලැබේ.)

(ආ) අධ්‍යාපන සුදුසුකම් :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/ දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයන් හයක් (06) කවර හෝ විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ්‍ය සහිතව සමත් වී තිබීම.

(ඇ) වයස :-

- අවු. 18 ට නොඅඩු හා අවු. 30 ට නොවැඩි විය යුතුය.
  (ඒ අනුව 2007.09.19 දිනට හෝ ඊට පෙර හා 1995.09.19 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත)

(ඇ) සුදුසුකම් පිළිබඳ සීමාවන් :-

I. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර වනවිට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.
II. ඉහත 06 (අ) හි සඳහන් සුදුසුකම් තනතුරට බඳවා ගන්නා තෙක් පැවතිය යුතුය.
III. ශරීරයේ පච්ච (Tattoos) තිබීම වැනි ශාරීරික වෙනස්කම් සිදු කර තිබීම සහ ශාරීරික දුබලතා සහිතවීම නුසුදුසුකමක්වන බව ද සැලකිය යුතුය.

07. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

7.1 විභාග ගාස්තුව 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය. :

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions),
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon), iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon).

සටහන :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.
(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.
(ඇ) විභාගය සඳහා ගෙවනු ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

7.2 අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 සැප්තැම්බර් මස 01 වැනි දින පෙ.ව. 09.00**ට විවෘතවන අතර **2025 සැප්තැම්බර් මස 19 වැනි දින ප.ව. 09.00**ට අවසන් වේ.

7.3 දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

7.4 අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

7.5 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් ( E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස්

තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.6 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය.

එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

7.7 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

08. විභාගයට ඇතුළු වීම :-

(අ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකු ම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට / ඇයට සිදු වනු ඇත.

(ආ) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :-

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ. :

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගත යුතුය. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :

අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

11. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ,
(ආ) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

12. බඳවා ගැනීමේ ක්‍රමය :

(1) ලිඛිත විභාගය :-
මෙම දැන්වීමේ 02 ඡේදයේ සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 02 කින් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයයයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතුය. අපේක්ෂකයින් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වේ.

විෂයයන් : 1. සාමාන්‍ය බුද්ධිය
2. සාමාන්‍ය දැනීම

- ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

(අ) *සාමාන්‍ය බුද්ධිය .-* කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි. සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් ආශ්‍රයෙන් සිතීමේ තර්කානුකූලභාවය, සිතීමේ විශ්ලේෂණ කුසලතාව, නිර්ණය කිරීමේ ශක්තිය, විනිශ්චය කිරීම සඳහා සැකසූ ප්‍රශ්න 50 කින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

(ආ) *සාමාන්‍ය දැනීම.-* කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි. ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ආශ්‍රයෙන් වැදගත්වන කරුණු ඇතුළත් දැනුම පරීක්ෂා කිරීම සඳහා සැකසූ ප්‍රශ්න 50 කින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

(2) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය :
පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයක් ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ නම් අකාරාදී පිළිවෙළට විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙතින් ගෙන්වා ගෙන එම අයදුම්කරුවන් සඳහා පමණක් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

පිරිමි - මීටර් 1000 (1km) මිනිත්තු 03, තත්පර 44 ක කාලයක් තුළ දිවීම.
කාන්තා - මීටර් 400 (0.4km) මිනිත්තු 02, තත්පර 05 ක කාලයක් තුළ දිවීම.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් යෝග්‍යතා පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලැබේ.

(3) යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:-

(i) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳව සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) පහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ලකුණු ලබා දීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ඇත.

| *ලකුණු දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 15 | |
| ක්‍රීඩා කෞශල්‍යය | 30 | |
| නායකත්වය හා ප්‍රජා සේවාවන් | 25 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | **100** | |

(iii) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් පමණක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කෙරේ. මූලික සුදුසුකම් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ම පරීක්ෂා කරනු ලැබේ. (ලිඛිත විභාගයේ දී අයදුම්කරුවන් ලබාගත් ලකුණු මෙම අවස්ථාවේ දී කැඳවනු නොලැබේ.)

(IV) යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී එක් එක් අයදුම්කරුවන් ලබාගත් ලකුණු නැවත විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීමෙන් පසු එම අපේක්ෂකයන් ලිඛිත විභාගයේ දී සහ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් මුළු ලකුණු එකතුව මත පිළිවෙළින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් නියාමක තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

(V) විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exams.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ දැනුම් දීම අනුව සිදු කරනු ඇත.

*සැලකිය යුතුයි.*- සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගි වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

- කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.
- මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.
- මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතුය.

එච්. එම්. එන්. සී. ධනසිංහ,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ/බ).

2025 අගෝස්තු මස 22 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150,
බේස්ලයින් පාර,
කොළඹ 09.

08-340

## අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, II වන පෙළ ජේලර් හා II වන පෙළ පුනරුත්ථාපන නිලධාරීන් බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය - 2025

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින II පෙළ ජේලර් (කාන්තා/පිරිමි) හා II පෙළ පුනරුත්ථාපන නිලධාරී (කාන්තා/පිරිමි) තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

i. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජේලර් (කාන්තා/පිරිමි) II පෙළ හා පුනරුත්ථාපන නිලධාරී (කාන්තා/පිරිමි) II පෙළ තනතුර සඳහා වේ.

ii. ලිඛිත විභාගය .- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

(i) බුද්ධි පරීක්ෂණය,
(ii) සංඛ්‍යාත්මක කුසලතා.

02. විභාග දිනය සහ විභාගය පැවැත්වීම :

මෙම විභාගය 2025 නොවැම්බර් මස උපලේඛනය 1 හි දැක්වෙන දිවයින පුරා පිහිටි ප්‍රධාන නගරවල දී පැවැත්වෙනු ඇත. දක්වා ඇති උපලේඛනයේ සඳහන් නගර අතරින් විභාගය සඳහා පෙනී සිටීමට අපේක්ෂිත නගරය, අංකය සමඟ පැහැදිලිව දැක්විය යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. එහෙත් කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් අයදුම්කර නොමැති වුවහොත්, අයදුම්කරු විසින් අයදුම්පතේ දෙවන තේරීම යටතේ සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත ඔවුන් යොමු කරනු ඇත. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් අයදුම්කර නොමැති වුවහොත් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමටත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු යොදනු ඇත.

***උපලේඛනය - 1***

| *ප්‍රධාන නගර හා අංක* | |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| මඩකලපුව | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුරය | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |

03. පත්කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 75 කි. ( II පෙළ ජේලර් (පිරිමි) – 55, II පෙළ ජේලර් (කාන්තා) – 07, II පෙළ පුනරුත්ථාපන නිලධාරී (පිරිමි) -10, II වන පෙළ පුනරුත්ථාපන නිලධාරී (කාන්තා) -03කි.) අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

04. සේවා කොන්දේසි :

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව අපේක්ෂකයකු අදාළ තනතුරේ II පෙළ ජේලර් / II පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට පත්කරනු ලැබේ.

4.2 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. II පෙළ ජේලර් / II පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද තනතුරට පත්ව වසර 07 ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත්වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ප්‍රදේශයක රාජකාරි භාර ගැනීමට ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත. II පෙළ ජේලර් / II පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරු සඳහා පත්වීම් ලබන්නන් පත්වීම් ලැබ මුල් වසර 05 ස්ථිර පදිංචි ප්‍රදේශයෙන් බැහැර බන්ධනාගාරවල නිරතවන බවට එකඟ විය යුතුය.

05. මාසික වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි RS – 3/2025 (පියවර 1) වැටුප් ඛණ්ඩය අදාළ වේ. එම වැටුප් ඛණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 55,410-7x670-2x890-25x1,190-රු. 91,630(මාසික)

(2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු. 55,410 ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ).

06. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු අතර, එය පොලිස් නිශ්කාෂණ වාර්තා මගින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත අවිවාහක අයවළුන් විය යුතුය. (දික්කසාද වූවන් හා වැන්දඹුවන් අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි)
(iv) පිරිමි - අවම උස අඩි 5 අඟල් 6ක් විය යුතුය.
කාන්තා - අවම උස අඩි 5 අඟල් 4ක් විය යුතුය.
(v) පපුව හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුය. (කාන්තාවන් සඳහා අදාළ නොවේ.)
(vi) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් හතර (04) ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) එකවර සමත්ව තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

(ඇ) වයස :

I. II පෙළ ජේලර් - අවු. 18 ට නොඅඩු හා අවු. 26ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2007.09.19 දිනට හෝ ඊට පෙර හා 1999.09.19 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

II. II පෙළ පුනරුත්ථාපන නිලධාරි - අවු. 18 ට නොඅඩු හා අවු. 26ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2007.09.19 දිනට හෝ ඊට පෙර හා 1999.09.19 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඈ) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

I. ආගමික පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

II. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වනවිට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

III. II පෙළ ජේලර්/ II පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට බඳවා ගන්නා තෙක් ඉහත 06 (අ) හි සඳහන් සුදුසුකම් බලපැවැත් වේ.

IV. ශරීරයේ පච්ච (Tattoos) තිබීම වැනි ශාරීරික වෙනස්කම් සිදු කර තිබීම සහ ශාරීරික දුබලතා සහිත වීම නුසුදුසුකමක්වන බව ද සලකන්න.

07. **විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු.600.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් ( Any Bank Debit Card with the Facility of Internet Transactions)
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් ( Online Banking Method of Bank of Ceylon)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් ( Any Branch of the Bank of Ceylon)

**සටහන :-**

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

08. **ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

8.1 අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට ( Online ) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 සැප්තැම්බර් මස 01 වැනි දින පෙ.ව. 09.00** ට විවෘතවන අතර **2025 සැප්තැම්බර් මස 19 වැනි දින ප.ව. 09.00** ට අවසන්වේ.

8.2 දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

8.3 අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

8.4 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E- mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.5 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.6 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

09. **විභාගයට ඇතුළු වීම :**

(අ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට / ඇයට සිදු වනු ඇත.

(ආ) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගත යුතුය. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :**

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

12. **විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :**

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
(ආ) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

13. **බඳවා ගැනීමේ ක්‍රමය :**

(1) ලිඛිත විභාගය :
මෙම දැන්වීමේ 01 ඡේදයේ II කරුණේ සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 02කින් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතුය. අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වේ.

විෂයයන් : 1. බුද්ධි පරීක්ෂණය
2. සංඛ්‍යාත්මක කුසලතා

- ලිඛිත විභාගයෙහි විෂය නිර්දේශය :

(අ) බුද්ධි පරීක්ෂණය :- කාලය පැය 01කි. මුළු ලකුණු 100යි. තර්කානුකූල විවරණය හා විග්‍රහ කිරීමේ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමාන කිරීමේ හැකියාව මැන බැලීම සඳහා බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

(ආ) සංඛ්‍යාත්මක කුසලතා :-කාලය පැය 01කි. මුළු ලකුණු 100යි. මූලික ගණිතමය සංකල්ප තේරුම් ගැනීම හා භාවිතය පිළිබඳ කුසලතා මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රයකි.

(2) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය :

පවත්නා පුරප්පාඩු ප්‍රමාණය මෙන් 1:3 අනුපාතයට ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ගේ නම් අකාරාදී පිළිවෙළට විභාග කොමසාරිස් ජනරාල් වෙතින් ගෙන්වා ගෙන එම අයදුම්කරුවන් සඳහා පමණක් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

පිරිමි - මීටර් 1000 (1Km) මිනිත්තු 03 තත්පර 44ක කාලයක් තුළ දිවීම.
කාන්තා - මීටර් 400 (0.4Km) මිනිත්තු 02 තත්පර 05ක කාලයක් තුළ දිවීම.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් යෝග්‍යතා පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලැබේ.

(3)යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :-

(I) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳව සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලැබේ.

(II) පහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ලකුණු ලබා දීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ඇත. ලකුණු පටිපාටිය මේ සමඟ ඉදිරිපත් කර ඇත.

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 10 | |
| පරිගණක සාක්ෂරතාවය | 10 | |
| ක්‍රීඩා කුසලතා | 20 | |
| නායකත්වය සහ ප්‍රජා සේවා කටයුතු | 20 | |
| විශේෂ දක්ෂතා හා කුසලතා | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 10 | |
| එකතුව | 100 | |

(III) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් පමණක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කෙරේ. මූලික සුදුසුකම් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම පරීක්ෂා කරනු ලැබේ. (ලිඛිත විභාගයේදී අයදුම්කරුවන් ලබා ගත් ලකුණු මෙම අවස්ථාවේදී කැඳවනු නොලැබේ)

(IV) යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී එක් එක් අයදුම්කරු ලබාගත් ලකුණු නැවත විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීමෙන් පසු එම අපේක්ෂකයන් ලිඛිත විභාගයේදී සහ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් මුළු ලකුණු එකතුව මත පිළිවෙළින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් II පෙළ ජේලර්/ II පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

(V) විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exams.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ දැනුම් දීම අනුව සිදු කරනු ඇත.

***සැලකිය යුතුයි*** :- සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

❖ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.
❖ මෙහි සඳහන් නොවන යම් කරුණක් වේනතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.
❖ මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් පවතී නම්, සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතුය.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)

2025 අගෝස්තු මස 22 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150,
බේස්ලයින් පාර,
කොළඹ 09.

08-341

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි Iශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් **2025 වර්ෂයේ දී කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පනවන නීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු* : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයයකට පළමුවරට අයදුම් කරන අපේක්ෂකයින්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු අයදුම් කරන ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 500ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු. 1,000ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ලංකා බැංකුවේ, බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7041443ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවනසේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. අයදුම්පත් :

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එම ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් පිළියෙල කළයුතුය. ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් වනසේ සකස් කළ යුතුය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂාවෙන් සම්පූර්ණ කරන ලද අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ භාෂාවෙන් සම්පූර්ණ කරන ලද අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරුලියනය කර හෝ අත් අකුරින් හෝ නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, අපේක්ෂකයින් විසින් අංශ ප්‍රධානියා මගින් **2025.09.25** වැනි දිනට පෙර ලැබෙන සේ "ආගමන හා විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", බත්තරමුල්ල." යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. *නැතහොත්* අතේ රැගෙනවිත් පාලන අංශයේ අදාළ විෂයභාර කළමනාකරණ සේවා නිලධාරි වෙත භාර දී ලද බවට ලිපියක් ලබාගත යුතුය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "බලයලත් නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025" යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා අයදුම්පත් බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් යොමු කර ඇති අපේක්ෂකයින් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, 0112101553 දරන දුරකතන අංකය ඔස්සේ ඒ බව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලකවරයා (පාලන) වෙත දැන්විය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් අංක 0115980257 මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර විමසා සිටීම ද ප්‍රතිඵලදායි වනු ඇත.

07. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම ප්‍රවේශ පත්‍රයේ නිශ්චිතව සඳහන් නිලධාරියකුගෙන් අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපතිවරයා වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. විභාගයට ඉල්ලුම් කරන අවස්ථාව වනවිට පැවති අයදුම්කරුගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළවන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

09. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. මේ සඳහා ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. අපේක්ෂකයකු තම භාෂා මාධ්‍ය තෝරාගැනීමේ දී, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද, තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය වශයෙන් තෝරාගත යුතුය. විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. *විභාග පටිපාටිය* :

1. විභාගයේ නම : ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම

2. විභාගය පිළිබඳ විස්තර :

| *විෂයය අංකය* | *විෂයය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණ* |
|---|---|---|---|---|
| 01 | සිද්ධි අධ්‍යයනය | පැය 02 | 100 | 40% |
| 02 | ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති සහ මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා :

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට අවම වශයෙන් දෙවරක්

5. විභාගය සඳහා වන විෂයය නිර්දේශය:

| *විෂයය අංකය* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| 01 | සිද්ධි අධ්‍යයනය | 1. ප්‍රත්‍යන්ත පාලන (Border Control)<br>2. මානව කුට්ටනය (Human Trafficking)<br>3. මානව ජාවාරම ( Human Smuggling) යන විෂයයන්ට අදාළ සිද්ධි අධ්‍යයනය |

| *විෂයය අංකය* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| 02 | ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති සහ මුදල් රෙගුලාසි | 1. ආයතන සංග්‍රහයේ V, VIII, XII, XIV, XV, XVI, XLVII, XLVIII පරිච්ඡේද<br>2. අංක 2310/29 හා 2022.12.14 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති<br>3. මුදල් රෙගුලාසි සංග්‍රහයේ (මු.රෙ.124, 125, 127, 128 සහ 135, මු.රෙ. V, VI, XI පරිච්ඡේද හා VII පරිච්ඡේදයේ II කොටස) හා මිල දී ගැනීමේ (ප්‍රසම්පාදන) මූලධර්ම හා විධිවිධාන |

*සටහන* **:**

* ඉහත විෂයන්ට එකවරම හෝ වෙන වෙනම පෙනී සිටිය හැකිය.

* නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ආගමන හා විගමන පාලක ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

**අයි. චමින්ද පතිරාජ,**
ආගමන හා විගමන පාලක ජනරාල් *(වැ.බ)*
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

2025 අගෝස්තු මස 26 වැනි දින,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරුපාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි I ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (2025)**

Efficiency Bar Examination for Authorized Officers Grade I of the Department of Immigration and Emigration- 2014 (2025)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

..........................................................................................................................

(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
..............................................................................................................................................
(උදා : GUNAWARDHANA H. M. S. K.)

1.3 සම්පූර්ණ නම :
..............................................................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

02. 2.1 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය :
..............................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය : ...................................................
.........................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :
..............................................................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

03. ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ජංගම දුරකථන අංකය :

06. දුරකථන අංකය (නිවස) :

07. විද්‍යුත් තැපැල් ලිපිනය :

08. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත්වන විෂයය/ විෂයයන් :

| *අනු අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| | | |
| | | |

09. උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

10. දැනට දරන තනතුර :
    10.1 තනතුර : ....................................................................................
    10.2 පත්වීම් ලිපියේ අංකය : ...............................................................

11. 11.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? ...................................................................
    11.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව : .................
    11.3 ලදුපත් අංකය : ................................
    11.4 දිනය : .............................................

| |
|---|
| ලදුපත මෙහි අලවන්න (අදාළ නම් පමණි)<br>ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

12. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව වශයෙන් රුපියල් ...................................... ක් ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

.................................................,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය : ................................

තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

13. *අත්සන සහතික කිරීම* :

මගේ දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියකු /නිලධාරිනියක සහ මා විසින් පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ...... ....................................................................................... මයා/ මිය/ මෙනවිය ...................................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

....................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම : ..............................................................
පදවි නාමය : ....................................................
ලිපිනය : ..........................................................
දිනය : ............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

14. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්, සහතික කරමි.

..................................................................දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.
සහ නිල මුද්‍රාව

08-355

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.